**කෘෂිකාර්මික අංශය නවීකරණ සඳහා වූ ව්‍යාපෘතිය - 01 වන කොටස - 2018**

**-----------------------------------------------------------------------------------------**

කෘෂිකාර්මික අංශය නවීකරණය සඳහා වූ ව්‍යාපෘතියේ 01 වන කොටසේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ජාත්‍යන්තර සංවර්ධන සමායතනය අතර 2017 ජනවාරි 17 දින එළඹි අංක 5873 එල් කේ දරන මූල්‍ය ගිවිසුමේ 2 උපලේඛණයේ II, බී 3 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගෙ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතු යැයි මා සලකන මාගේ අදහස් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා කාලය

ව්‍යාපෘතියේ 1 කොටසේ මූල්‍ය ගිවිසුම අනුව, එවකට කෘෂිකර්ම අමාත්‍යාංශය වර්තමානයේ ප්‍රාථමික කර්මාන්ත සහ සමාජ සුභ සාධන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ හා කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ අරමුණු වන්නේ උතුරු, නැගෙනහිර, උතුරුමැද, මධ්‍යම සහ ඌව පළාත්වල කෘෂිකර්ම ඵලදායීතාවය ඉහළ නැංවීම, වෙළඳපොළ ප්‍රවේශයන් වැඩිදියුණු කිරීම සහ සුළු පරිමාණ ගොවීන්ගේ හා කෘෂි ව්‍යාපාර මඟින් කෙරෙන අගය එකතු කිරීම් වැඩි දියුණු කිරීමට සහය ලබා දීම වේ. ව්‍යාපෘති කටයුතු ආයෝජන ආරම්භක සහාය, ගොවි නිෂ්පාදන සංවිධාන සහ ගොවි ව්‍යාපාර සඳහා ප්‍රාග්ධන ගැලපුම් ප්‍රදාන, අර්ධ ණය ඇපකර ලබා දීමට සහාය වීම යන සංරචක 03 යටතේ ක්‍රියාත්මක වේ. මූල්‍ය ගිවිසුම අනුව ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 15,612.27 කට සමාන එජඩො මිලියන 106.97 ක් වූ අතර ඉන් රු.මිලියන 9121.88 කට සමාන එජඩො මිලියන 62.5 ක් සැපයීමට ජාත්‍යන්තර සංවර්ධන සමායතනය එකඟ වී තිබුණි. ඉතිරි වටිනාකම වූ රු.මිලියන 6481.64 කට සමාන එජඩො මිලියන 44.1 ක් ප්‍රතිලාභීන් විසින්ද, රු.මිලියන 54 කට සමාන එජඩො මිලියන 0.37 ක් ශ්‍රී ලංකා රජය විසින්ද දායක වීමට එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2016 ඔක්තෝබර් 15 දින පෙරගාමී මූල්‍යයනය යටතේ ආරම්භ කරන ලද අතර 2021 ඔක්තෝබර් 31 වන විට නිම කිරීමට සැලැසුම් කර තිබුණි.

## 1.3. තත්ත්වාගණනය කළ මතය

මාගේ වාර්තාවේ 2.1 වගුවෙන් විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, ව්‍යාපෘතියේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ක්‍රියාකාරිත්වය හා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4. තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තිරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ව්‍යාපෘතිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ව්‍යාපෘතිය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ව්‍යාපෘතියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.
ව්‍යාපෘතිය වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ,වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ මාගේ මතය ඇතුලත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ.සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්,ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත.වංචා හා වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශයන් ඇති විය හැකි අතර මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැක මුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි, තවද

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මගහරවා ගැනීමට,ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ.ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර,දුස්සන්ධානය,ව්‍යාජ ලේඛණ සැකසීම,චේතනාන්විත මග හැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීම වංචාවක් ඇතිවීමට හේතු වේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත් අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල කළමනාකරණය විසින් කරන ලද සාධාරණත්වය හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක් කල අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශන වල ඇතුලත් බව අගයන ලදී.

මාගේ විගණනය තුලදී හඳුනාගත් වැදගත් විගණන සොයා ගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1. ගිණුම්කරණ අඩුපාඩු

| ගිණුම්කරණ අඩුපාඩු | බලපෑම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
| --- | --- | --- | --- |
| (අ) ව්‍යාපෘති ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමේදී ප්‍රතිලාභීන්ගේ දායකත්වය වෙනම හඳුනා ගැනීමට හා වාර්තා කිරීමට කටයුතු කර නොතිබුණි. | අරමුදල් සැපයීම අඩුවෙන් දැක්වීම | වාණිජ බැංකු මගින් ප්‍රතිලාභීන්ට ණය නිදහස් කල පසු මෙම අගය වාර්තා කිරීමට කටයුතු කරනු ලැබේ. | ප්‍රතිලාභීන්ගේ දායකත්වය හඳුනා ගැනීම අවශ්‍ය වන අතර මූල්‍ය ප්‍රකාශන හෙළිදරව් කල යුතුය. |
| (ආ) විදේශ විනිමය ගණුදෙනු මත වූ විනිමය ලාභ රු.මිලියන 231.77 ක් ව්‍යාපෘති මෙහෙයුම් වියදම් වලට එරෙහිව හිලව් කර තිබුණි. | ව්‍යාපෘති මෙහෙයුම් වියදම් අඩුවෙන් දැක්වීම. | නිසි ලෙස අදහස් දක්වා නොමැත. | විනිමය ලාභ මූල්‍ය ප්‍රකාශන වල වෙනම වාර්තා කල යුතුය. |

### 2.2. නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම.

| නීති රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | බලපෑම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
| --- | --- | --- | --- | --- |
| 2007 අගෝස්තු 07 දිනැති අංක එම්ඕඑෆ්පී/ඊආර්ඩී/2007/ 002 දරන චක්‍රලේඛය | 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 31 දින හෝ ඊට පෙර දින විගණනයට ඉදිරිපත් කල යුතු වූවත් 2019 අප්‍රේල් 25 ඉදිරිපත් කර තිබුණි. | චක්‍රලේඛය සහ ණය දෙන ආයතනය විසින් නියම කර ඇති ප්‍රධාන අවශ්‍යතාවයට අනුකූල නොවීම. | කාර්ය මණ්ඩලයේ අඩුව හේතුවෙන් ප්‍රමාද වූ අතර දෝෂය නිවැරදි කිරීමට පියවර ගනු ලැබේ. | චක්‍රලේඛය උපදෙස් වලට අනුකූල විය යුතුය. |

## 3. භෞතික කාර්යසාධනය

### 3.1. ව්‍යාපෘති ක්‍රියාකාරකම් වල භෞතික ප්‍රගතිය

ආයෝජන සූදානම් කිරීම සඳහා සහාය ලබා දීම, කෘෂි නිෂ්පාදන සංවිධානවලට ප්‍රාග්ධන ගැලපුම් දීමනා ලබා දීම සහ ප්‍රාග්ධන ගැලපුම් දීමනා ලබා දීමේ වැඩසටහන යටතේ ප්‍රතිලාභීන්ට ණය දීමට උනන්දුවක් දක්වන සහභාගීත්ව මූල්‍ය ආයතන සමඟ මූල්‍ය අවදානම බෙදා ගැනීමට ණය කොටසක් සඳහා ඇප වීම යන සංරචක 03 න් ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් සමන්විත වේ. ව්‍යාපෘතියේ කටයුතු ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය පිළිබඳව පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| සංරචකය | 2018 දෙසැම්බර් 31 දිනට අපේක්ෂිත භෞතික කාර්යසාධනය | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| කෘෂි නිෂ්පාදන සංවිධානවලට ප්‍රාග්ධන ගැලපුම් දීමනා ලබා දීම. | යාපනය, මුලතිව්, අනුරාධපුරය, මඩකලපුව, මොණරාගල, මාතලේ හා පොළොන්නරුව දිස්ත්‍රික්කවල කෘෂි නිෂ්පාදන සංවිධාන 350ට සහාය වීමට ව්‍යාපෘතිය අපේක්ෂා කරන ලදී. කෙසේ වෙතත් ඉහත දිස්ත්‍රික්ක වල කෘෂි නිෂ්පාදන සංවිධාන 61 ට එකතුව රු.මිලියන 579.97 ක මුදලක් නිදහස් කර තිබුණි. 2018 දෙසැම්බර් 31 දින වන විට, එම මුදලින් රු. මිලියන 52.37 ක් පමණක් මුලතිව් හා මඩකලපුව දිස්ත්‍රික්ක වල කෘෂි නිෂ්පාදන සංවිධාන 07 කට ලබා දී ඇත. | වෙන්කරන ලද මුදල් ඌණ උපයෝජනය | මෙම ගැටළුව 2019 විසඳීමට පියවර ගනු ලැබේ. | ප්‍රාග්ධන ගැලපුම් ප්‍රදාන ලබා දීම සඳහා කඩිනම් පියවර ගත යුතුය. |
| ආයෝජන යෝජනා සකස් කිරීම. | ඌව, මධ්‍යම හා වයඹ පළාත් වලට තාක්ෂණික සේවා සපයන්නන් 02 කු සඳහා කොන්ත්‍රාත් ප්‍රදානය කර ඇත.<br>එයින් සේවා සැපයුම්කරුවකු පමණක් යෝජනා 15 ක් සම්පූර්ණ කර ඇති අතර 2018 දෙසැම්බර් 31 දින වන විට රු. මිලියන 1.61 ක මුදලක් ඒ මත නිදහස් කර ඇත. | ව්‍යාපෘති කටයුතු නිම කිරීමේදී ඇතිවිය හැකි ප්‍රමාදයන් | තාක්ෂණික සේවා සපයන්නන් 02 කුට ආයෝජන යෝජනා සකස් කිරීම සඳහා කොන්ත්‍රාත්තු ලබා දුන් නමුත් ඒවා අවශ්‍යතාවයට අනුකූල නොවීය. | ප්‍රදානය කිරීමට පෙර කොන්ත්‍රාත්කරුගේ ධාරිතාවය තක්සේරු කිරීමට පියවර ගත යුතුය. |
| අර්ධ ණය ඇපකර | එජඩො මිලියන 7.12 ක් අර්ධ ණය ඇපකර සංරචකය යටතේ වෙන් කිරීම 2018 දෙසැම්බර් 31 දක්වා භාවිතා කර නොමැත. | අපේක්ෂිත ප්‍රතිලාභ ප්‍රතිලාභීන්ට නොලැබෙනු ඇත. | පරිපාලනමය විධි විධාන වල ඇති ගැටළු හේතුවෙන් ආදාල බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් අදාල කටයුතු ආරම්භ කිරීමට පියවර ගෙන නොතිබුණි. | බලපත්‍රලාභී වාණිජ බැංකු හරහා ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමට සහාය ලබා ගැනීමට පියවර ගත යුතුය. |

### 3.2. නිෂ්ක්‍රිය සම්පත්

| විගණන ගැටළුව | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| ණය දෙන ආයතනය විසින් බැර කරන ලද එජඩො මිලියන 13.93 ක මුදලින් 2018 දෙසැම්බර් 31 වන විට භාවිතා කර ඇත්තේ එජඩො මිලියන 5.87 ක් පමණි. එජඩො මිලියන 8.06 ක ශේෂය මාස 06 කට වැඩි කාලයක් ශ්‍රී ලංකා මහ බැංකුවේ විශේෂ ඩොලර් ගිණුමේ වියදම් නොකර තිබුණි. තවද රු.මිලියන 212.79 ක් වන තවත් ශේෂයක් ව්‍යාපෘතියේ ජංගම ගිණුමේ තිබුණි. | දුර්වල මූල්‍ය කළමනාකරණය හේතුවෙන් අරමුදල් ඌණ උපයෝජනය | නියමිත කාලසීමාව තුල එජඩො මිලියන 13.93 ක් වැය කිරීමට ඇස්තමේන්තු කර තිබුණි. කෙසේ වෙතත්, ආධාරකරුවන්ගෙන් බොහෝ දෙනෙක් ප්‍රදානය සඳහා සුදුසුකම් සහ නිර්ණායක සපුරා ගැනීමට අසමත් වූහ. | නිවැරදි කිරීම සඳහා පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| පසුගිය වර්ෂයේදී ව්‍යාපෘතිය විසින් රු.මිලියන 4.25 ක් වැය කර ප්‍රසම්පාදනය කරන ලද ජාලගත ගෝලීය තොරතුරු පද්ධති මෘදුකාංගය වර්ෂයකට වැඩි කාලයක් අපේක්ෂිත අරමුණු සඳහා භාවිතා කර නොතිබුණි. | පූර්ව සැලැසුමකින් තොරව වත්කම් ප්‍රසම්පාදනය කිරීම. | ගෝලීය තොරතුරු පද්ධති උපදේශකයෙකු බඳවා ගැනීමේ ක්‍රියාවලිය ක්‍රියාත්මක වේ. | සවිස්තරාත්මකව දත්ත පදනම ක්‍රියාත්මක කිරීම අවශ්‍ය වේ. |

**3.3. මානව සම්පත් කළමනාකරණය සම්බන්ධ නිරීක්ෂණ**

| සේවක වර්ගය | අනුමත | තනතුරු සංඛ්‍යාව 2018/12/31 දිනට තත්‍ය | පුරප්පාඩු | බලපෑම | කළමනාකරණ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|---|---|
| ව්‍යාපෘති කළමනාකරු | 01 | - | 01 | ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් හා ව්‍යාපෘති අධීක්ෂණ ඒකකයේ පරිපාලනය අකර්මන්‍ය වේ. මූල්‍ය හා වෙනත් පාලනයේ පිළිබඳ අධීක්ෂණය ලිහිල් වනු ඇත. | සුදුසු නිලධාරියෙකු බඳවා ගැනීමට පියවර ගනු ලැබේ. | ප්‍රධාන කළමනාකරණ තනතුරු සඳහා පුද්ගලයින් බඳවා ගැනීමට වහාම පියවර ගත යුතුය. |
| අභ්‍යන්තර විගණක | 01 | - | 01 | | | |

**3.4. පද්ධති හා පාලන**

| විගණන ගැටළුව | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| ව්‍යාපෘතියේ අරමුණු ඉටු කර ගැනීම සඳහා පරිපූර්ණ ක්‍රියාකාරී සැලැස්මක් ව්‍යාපෘතිය විසින් සකස් කර නොතිබුණි. | ව්‍යාපෘතියේ අරමුණු ඉටු කර ගැනීම සඳහා භෞතික හා මූල්‍ය මත වන කාල ඉලක්ක මැනිය නොහැකි වනු ඇත. | ව්‍යාපෘති 687 න් 81 ක් ඒ සඳහා පත් කරන ලද කමිටුව විසින් අනුමත කරන ලද අතර ඉතිරිය 2018 සැප්තැම්බර් දක්වා සැකසුම් මාර්ගයේ පැවතුණි. | සවිස්තරාත්මක ක්‍රියාකාරී සැලැස්මේ අවශ්‍යතාවය අවධාරණය කෙරේ. |